www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ වතු කම්කරු අරගලය සන්ධිස්ථානයක

## Strike by Sri Lankan plantation workers at the crossroads

**සමාජවාදී සමානතා පක්ෂය**
**2006 දෙසැම්බර් 19**

ඉහල වැටුපක් සඳහා ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන් ලක්ෂ පහකගේ අරගලය තුන්වන සතියට එලඹ තිබේ. ඔවුන්ගේ අධිෂ්ඨානය, වහ වහාම වර්ජනය අවසන් කිරීමට පාලනාධිකාරය හා ආන්ඩුව සමඟ කුමන්ත්‍රනයක යෙදී සිටින වෘත්තීය සමිති නායකයින්ගේ ප්‍රයත්නයන්ට මුලුමනින් ම ප්‍රතිවිරුද්ධව පිහිටා ඇත.

කම්කරු පන්තියේ පරිපීඩිතම කොටසක් වන දිවයිනේ තේ සහ රබර් වතු කම්කරුවෝ රුපියල් 300ක දෛනික වැටුපක් ඉල්ලමින් දෙසැම්බර් 5 දා වැඩ නතර කලහ. ඔවුන්ගේ වර්තමාන වැටුප රුපියල් එකසිය තිස්පහකි. රුපියල් 60ක විවිධ දීමනා එයට අමුනා ඇත. වතු සමාගම් නියෝජනය කරන ශ්‍රී ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය රුපියල් 30ක මූලික වැටුප් වැඩිවීමක් සහ රුපියල් 25ක දීමනාවක් යෝජනා කර තිබේ.

2004 වසරේ සිට ඔවුන්ට කිසිදු වැටුප් වැඩිවීමක් ලැබී නැති නිසා කම්කරුවන්ගේ කෝපය උත්සන්න වී ඇත. කම්කරු පන්තියේ සෙසු කොටස් මෙන් ම වතු කම්කරුවෝ ද වේගයෙන් ඉහල නැගෙන බඩු මිලෙහි ප්‍රහාරයට ගොදුරුව සිටිති. ඔවුන්ට ගෙවනු ලබන්නේ වැඩ කරන දිනවලට පමනි. පැමිනීම, නිෂ්පාදනය සහ මිලගනන් මත රැඳී තිබෙන දීමනාව බොහෝ කම්කරුවන්ට ලැබෙන්නේ නැත.

ආරම්භයේ සිට ම වෘත්තීය සමිති උත්සහා කලේ , කම්කරුවන්ගේ විරුද්ධත්වය පාලනය කර ඉල්ලීම් සීමා කිරීමට ය. දේශපාලන පක්ෂ ලෙස ද ක්‍රියාත්මක වන ප්‍රධාන වෘත්තීය සමිති දෙක - ලංකා කම්කරු කොංග්‍රසය ( සීඩබ්ලිව්සී ) සහ කඳුරට ජනතා පෙරමුන ( යූපීඑෆ්) - පාලක සභාගයේ කොටස්කරුවෝ ය. ඔවුන්ගේ නායකයන්ගේ පක්ෂපාතීත්වය සිය සාමාජිකයන් කෙරෙහි නොව වර්ජනය පැතිරීම වැලැක්වීමට මංමුලා සහගතව සිටින ආන්ඩුව කෙරෙහි ය.

සීඩබ්ලිව්සීය සහ ලංකා ජාතික වතු කම්කරු සංගමය ආරම්භයේ සිට ම වර්ජනයට විරුද්ධව සිටියත් සාමාජිකත්වය නායකත්වය ප්‍රතික්ෂේප කරමින් වර්ජනයට එක්ව සිටිති. එහි ප්‍රතිඵලයක් ලෙස සටන්කාමී කම්කරුවන් පාලනය කිරීමේ තීරනාත්මක කාර්යභාරය, සීමිත වැටුප් වැඩිවීමක් සඳහා උද්ඝෝෂනය ආරම්භ කල යූපීඑෆ් සහ තවත් සුලු සමිති ගනනාවක කර මතට වැටී ඇත. ජනාධිපති මහින්ද රාජපක්ෂගේ මැදිහත්වීම කෙරෙහි විස්වාසය තබන ලෙස යූපීඑෆ් නායක පී. චන්ද්‍රසේකරන් යලි යලිත් කම්කරුවන්ට ආයාචනා කලේ ය. තමන් පෙනී සිටින්නේ කවුරුන් වෙනුවෙන් දැයි පසු ගිය සිකුරාදා රාජපක්ෂ පෙන්නුම් කලේ ය. වතු කම්කරු වර්ජනය සම්බන්ධව විශේෂ අමාත්‍ය මන්ඩල රැස්වීමක් කැඳවූ ඔහු හාම්පුතුන්ගේ යෝජනාවට කම්කරුවන් එකඟ කරවා ගන්නා ලෙස චන්ද්‍රසේකරන්ට පැවසුවේ ය.

අහස උසට නගින බඩු මිල සහ විදේශ විනිමය වත්කම් පහල වැටීමක් සහිතව ආර්ථිකය දැනටමත් අර්බුදයකට ඇද වැටී ඇති හෙයින් දැන් සිදුවෙමින් පවතින වර්ජනය රටට දරාගත නොහැකි බව රාජපක්ෂ එහි දී ප්‍රකාශ කලේ ය.

කෙසේ නමුත් පසු ගිය වසර පුරාම ජනාධිපති රට යලි වතාවක් යුද්ධයට ඇද දමා තිබේ. සිවිල් ජනයා ඉලක්ක කරමින් එල්ල කරන බෝම්බ සහ ෂෙල්වෙඩිවලට ගෙවීම සඳහා රුපියල් බිලියන 139 දක්වා සියයට 45කින් හෙවත් දිනකට රුපියල් මිලියන 380ක් වන සේ ආරක්ෂක වියදම් ඉහල දමා ඇත. රජයේ වියදම්වලට මුදල් සැපයීම සඳහා ආන්ඩුව මුදල් අච්චු ගැසීම හා විදේශ මුල්‍ය වෙලදපලෙන් නය ගැනීම කරන අතර එහි අනිවාර්ය ආර්ථික පීඩනය කම්කරු පන්තිය දරා ගත යුතු යැයි කියා සිටී.

වර්ජනය පැතිරීයාමේ තර්ජනයට මුහුන දීමත් සමඟ රාජපක්ෂ යලි වතාවක් වාර්ගික ආතතිය ඇවිලවීමේ සෙල්ලමක යෙදී සිටියි. වර්ජනය වහා ම සමථයකට පත් කලේ නැතිනම් දෙමල විමුක්ති කොටි සංවිධානය ( එල්ටීටීඊ ) "වතුකරය විනිවිදිය" හැකි බවට ඔහු

චන්ද්‍රසේකරන්ට අනතුරු ඇඟවී ය. සිංහල හා දෙමල වතු කම්කරුවන් බෙදීම සඳහා ක්‍රියා පිළිවෙතක දැනුවත්ව ම වාර්ගික සැක කිරීම් ඇවිස්සීමෙහි සහ අවශ්‍ය වුව හොත් ඒකාධිපති බලතල යටතේ වර්ජකයන්ට විරුද්ධව දුෂ්ට රාජ්‍ය මර්දනයක් සඳහා පදනම සැකසීමෙහි යෙදී සිටියි.

ජනමාධ්‍ය බලාපොරොත්තු වූයේ ඉක්මනින්ම වර්ජනය අහවර වනු ඇති බවයි. නියෝජ්‍ය කම්කරු ඇමති මර්වින් සිල්වාට කම්කරුවන් ඇමතීම සඳහා ඉඩසැලසීමට චන්ද්‍රසේකරන් සහ කම්කරු එක්සත් පෙරමුනේ නායක (ඩබ්ලිව්යූඑෆ්) එස්. සතාසිවම් ඉරිදා හැටන් නගරයේ දී රැස්වීමක් සංවිධානය කලහ. වර්ජනය පාවා දෙනු ඇතැයි සැක කල කම්කරුවෝ සිය ගනනක් සෑම පලාතකම වතුවලින් හැටන් නගරයට රැස්වූහ. ඇමතිට කීමට ඇත්තේ කුමක් දැයි ඇසීමට වතු කම්කරුවෝ උත්සුකව සිටියහ.

වර්ජකයන් "නම්‍යශීලී" විය යුතු බවත් වතු සමාගම්වල යෝජනා පිලිගත යුතු බවත් ඔහු අවධාරනය කල විට කෝප වූ කම්කරුවන් හා නියෝජිතයෝ උනුසුම් වචන හුවමාරුවකින් සිල්වා නිහඬ කලහ. කලමනාකරුවන්ට රුපියල් 150,000ක මාසික වැටුපක් සහ සෙසු වරප්‍රසාද ලබා දෙද්දී තමන්ට වැටුප් වැඩිවීමක් දීමට සමාගම්වලට නොහැකි ඇයි දැයි කම්කරුවෝ ප්‍රශ්න කලහ. යුද්ධයට වියදම් කරන ආන්ඩුවට වතු කම්කරුවන්ට වියදම් කරන්ට මුදල් නැත්තේ මන්ද? වතු කම්කරුවන්ට වඩා හොඳ ජීවන තත්වයක් උදා කර දීම පිලිබඳව 2005 නොවැම්බර් මැතිවරනයේ දී ජනාධිපති දුන් පොරොන්දුවලට සිදු වූයේ කුමක් ද? ඔවුහු ප්‍රශ්න කලහ.

රැස්වීම උනුසුම් වෙද්දී සන්නද්ධ පොලීසිය රැස්වීම් ශාලාවට ඇතුලු වූ නමුත් කම්කරුවෝ භීතියට පත් නොවූහ. රාජපක්ෂට චෝදනා නොකරන ලෙස සිල්වා කම්කරුවන්ට ආයාචනා කල නමුත් කම්කරුවෝ යලිත් ඔහු නිහඬ කලහ. කැරලිකාරිත්වයට මුහුන දුන් චන්ද්‍රසේකරන් ක්ෂනිකව ම පිල්ල මාරු කරමින් කියා සිටියේ තමන් වර්ජනය නතර කරන ලෙස හෝ දිගට ම කර ගෙන යන ලෙස නො ඉල්ලන බවයි. වර්ජනය අවසන් කිරීමට උපාමාරු දමන ගමන් ඔහු කියා සිටියේ වර්ජනය ගැන "කම්කරුවන් තීන්දුව" ගතයුතු බවයි. කෙසේ නමුත් වර්ජනය අඛන්ඩව පෙරට ගෙන යාමේ දැවැන්ත මනෝගතියක් කම්කරුවන් තුල තිබුනි.

රැස්වීමෙන් පසුව, හාම්පුතුන් සමග වෙනම ගනුදෙනුවක් මගින් සීඩබ්ලිව්සීය කම්කරුවන් බෙද කිරීමේ උත්සාහය දෙගුන කලේ ය. වර්ජනය "බොහෝ දුර ගොස්" ඇති බව මාධ්‍යවලට ප්‍රකාශ කල සීඩබ්ලිව්සී නිලධාරියෙකු වූ යෝගරාජන් අලුතෙන් සාකච්ඡා ආරම්භ කල බව නිවේදනය කලේ ය. දැනටමත් එහි ඉල්ලීම රුපියල් 270ට කප්පාදු කර ඇති සීඩබ්ලිව්සීය, දිනකට රුපියල් 300ක වැටුපක් ගෙව්ව හොත් කර්මාන්තය "බිඳ වැටෙන" බවට කොලඹ තේ වෙලෙන්දන්ගේ සංගමය අඳෝනා නගන තතු තුල කම්කරුවන්ගේ ඉල්ලීම තව දුරටත් කප්පාදු කිරීමට සූදානම්ව සිටින බවට සැකයක් නැත.

වඩාත් දැවැන්ත අන්තරායක් නම්, වර්ජකයන්ගේ පැත්තේ සිටින බව පෙන්වමින් ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) තර ඇති ඍජු මැදිහත් වීමයි. ජවිපෙ සමස්ත ලංකා වතු කම්කරු සංගමය (ඒසීඊයූ) ඇතුලු වර්ජනයට සම්බන්ධ සියලු ම වෘත්තීය සමිති ඊයේ (18) ජනතා විමුක්ති පෙරමුනට සම්බන්ධ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ (එන්ටීයූසී) කාර්යාලයේ දී රැස්වූහ.

වතු කම්කරුවන්ට ඔවුන්ගේ ඉල්ලීම් නො ලැබුන හොත් සමස්ත මහා වර්ජනයක් කැඳවන බව ජවිපෙ වෘත්තීය සමිති නායක සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ලාල්කාන්ත රැස්වීමේ දී ප්‍රකාශ කලේ ය.

වතු කම්කරුවන් ඉහල වැටුපක් සහ වඩා හොඳ ජීවන තත්වයක් සඳහා ගෙන යන අරගලය කෙරෙහි කම්කරුවන් අතර පලල්ව පැතිරුන සහයෝගයක් තිබෙන බවට නිසැක ය. දිවයින පුරා මහා වර්ජනයක් රාජපක්ෂ ආන්ඩුවට සහ එහි පිලිවෙත්වලට එරෙහි අරගලයක් වන්නා සේ ම අන් සියල්ලටමත් වඩා වාර්ගික යුද්ධය සඳහා කම්කරුවන් පරිත්‍යාග කල යුතු බවට කෙරෙන ඉල්ලීමට එරෙහි දේශපාලන අරගලයක් ද අන්තර්ගත කර ගනී. කෙසේ නමුත් එල්ටීටීඊයට විරුද්ධ යුද්ධයේ වඩාත් දෘඪතර අද්වකාත්වරුන් වන ජනතා විමුක්ති පෙරමුන එවන් උද්ඝෝෂනයකට මුලුමනින්ම හතුරුව සිටී.

වෘත්තීය සමිති වර්ජනය පාවාදීම සඳහා තිරයට පිටුපසින් කුමන්ත්‍රනයක යෙදී සිටිද්දී මහා වර්ජනයක් ගැන ජවිපෙ කරන තර්ජනය කම්කරුවන්ගේ ඇස්වලට වැලි ගැසීම අරමුනු කරගත් රැවටිල්ලකි. ජවිපෙ දැනටමත් රාජපක්ෂට ජීවන හුස්ම සම්පාදනය කරමින් සිටී. වතුකරයේ දූෂන සොයා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලෙස ඔහුගේ මාධ්‍ය සාකච්ඡාවේ දී ලාල් කාන්ත ජනාධිපතිගෙන් ඉල්ලා සිටියේ ය. වැඩ වර්ජනය කෙලවර කිරීමේ මාධ්‍යයක් ලෙස කම්කරුවන්ගේ දුක් ගැනවිලි සොයා බැලීම සඳහා කමිටු පත් කිරීමේ දිගු ඉතිහාසයක් ශ්‍රී ලංකාවේ තිබේ. හැම විටම ලැබෙන්නේ එක ම ප්‍රතිඵලයකි. වර්ජනය අවසන් වීමෙන් පසු කමිටුව මාස ගනනක් "පරීක්ෂන" පවත්වයි. ඉක්බිතිව දුක් ගැනවිලි පදනම් විරහිත බව තීන්දු කරයි.

වර්ජනයේ යෙදී සිටින කම්කරුවන් මේ කිසිදු වෘත්තීය සමිති නායකයකු ගැන විශ්වාස නොතැබිය යුතු ය. සීඩබ්ලිව්සී සහ යූපීඑෆ් රට යලි යුද්ධයට ඇද දැමූ, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට ප්‍රහාර එල්ල කිරීම තීව්‍ර කර ඇති සහ පුද්ගලිකරනය සහ සමාජ සේවාවන් කප්පාදු කිරීමේ ලෝක බැංකුවේ ඉල්ලීම් ක්‍රියාවට දමන කැබිනට් මන්ඩලයේ කොටස්කරුවෝ ය. ජවිපෙ ආන්ඩුවේ කොටස්කරුවකු නොවීමේ එක ම හේතුව කම්කරු පන්තිය මත වඩා දැවැන්ත පීඩාවන් ඇති කරන එල්ටීටීඊයට විරුද්ධ සම්පූර්න යුද්ධයක් ඇවිලීමට පක්ෂව කතා කිරීම ය. වතු කම්කරුවන් ඇතුලු දහස් ගනනක් දෙමල ජනයා නඩු විභාගයකින් තොරව රඳවා තබා ගැනීමට සහ බොහෝ අවස්ථාවල දී වධ බන්ධනයට ලක් කිරීමට යොදා ගැනුනු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යලි ක්‍රියාත්මක කිරීමට මේ සියලු පක්ෂ සහයෝගය දුන්හ.

වර්තමාන වර්ජනය තීරනාත්මක සන්ධිස්ථානයකට පැමින ඇත. එය වර්තමාන වෘත්තීය සමිති නායකයන් අත තිබීමට ඉඩ ඇරිය හොත් එය පාවා දෙනු ඇත. චන්ද්‍රසේකරන් සහ ලාල් කාන්ත කරන්නේ කුමක් දැයි බලා නොසිට කම්කරුවන් තමන් විසින් ම මූලිකත්වය ගත යුතු ය. සමිති නායකයන් රැස්වීම් කැඳවන තුරු බලා නොසිට සෑම වත්තක ම කම්කරුවන් වර්ජන කමිටු තෝරා පත් කර ගත යුතු ය; ඒවා තම නියෝජිතයන් මධ්‍යම රැස්වීසකට යවා තමක්ගේමූලෝපායක් සකසා ගත යුතු ය.

වතු කම්කරුවන්ගේ ඉල්ලීම් පැහැදිලිව ම කම්කරු පන්තියේ සහ ගම්බද ජනයාගේ සහයෝගය දිනා ගෙන තිබේ. වර්ජනයට සහයෝගය දීමත් යහපත් වැටුපක් හා ජීවන තත්වයන් සඳහා ඔවුන්ගේ ම ඉල්ලීම් සැකසීමත් උදෙසා සිය කමිටු ගොඩනගන ලෙස සමාජවාදී සමානතා පක්ෂය (සසප) සියලු කම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. කම්කරුවන්ට තවත් මිත්‍යාවක් නොතිබිය යුතු ය. එවන් උද්ඝෝෂනයක් ආන්ඩුව සමග ගැටුමක් අවුලුවනු ඇති හෙයින් පැහැදිලි දේශපාලන මූලෝපායකින් මග පෙන්විය යුතු ය.

පහත සඳහන් ජාත්‍යන්තරවාදී සහ සමාජවාදි ක්‍රියාමාර්ගය සඳහා සසප සටන් වදීඃ

වෘත්තීය සමිති විසින් යෝජිත සීමිත වැටුප් වැඩි කිරීම මගින් කම්කරුවන්ගේ දුක් ගැහැට හා දුෂ්කරතා කෙලවර නොවනු ඇත. දෛනික වැටුප් ක්‍රමය අහෝසි කොට වඩා හොඳ අතිකාල ගෙවීම්, විශ්‍රාම වැටුප්, ලෙඩ නිවාඩු සඳහා ගෙවීම් සහිතව අවම වසයෙන් රුපියල් 15,000ක මාසික වැටුපක් අපි යෝජනා කරමු. ජීවන වියදමට ගැලපෙන පරිදි මෙම ගෙවීම් ස්වයංක්‍රීයව වැඩිවිය යුතු ය.

යහපත් නිවාස, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් කම්කරුවන්ට උවමනා ය. නල ජලය සහ විදුලිය ඇතුලු සියලු ම මූලික පහසුකම් සහිත නිවාස සියලු ම වතු කම්කරුවන්ට සම්පාදනය කල යුතු ය. යහපත් ජීවන තත්වයක් ලබා ගැනීම අයිතියක් මිස වරප්‍රසාදයක් නොවේ. සමාජය සමාජවාදී පිලිවෙතක් මත ප්‍රතිසංවිධානය කල විට ධනවත් අතලොස්සකගේ ලාභ ඉපැයීමේ උවමනාවන් සඳහා වෙනුවට බහුතරයක් වූ සාමාන්‍ය වැඩ කරන ජනයාගේ උවමනාවන්ට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත.

වැඩ කරන ජනතාව "ජාතිය උදෙසා පරිත්‍යාග කරන" ලෙස ඉදිරිපත් වන සියලු ම ඉල්ලීම් ප්‍රතික්ෂේප කල යුතු ය. වාර්ගික යුද්ධයට එක සතයක් එක මිනිසෙක් නොදිය යුතු ය. උතුර සහ නැගෙනහිර මිලිටරි වාඩිලා ගැනීම අවසන් කරන ලෙසත් එම ප්‍රදේශවල සිටින සියලු ම සන්නද්ධ හමුදාවන් කොන්දේසි විරහිතව ආපසු කැඳවන ලෙසත් සසප ඉල්ලා සිටී. සියලු ම රූපාකාරයන්ගේ ජාතිකවාදයන් සහ වර්ගවාදයන් ප්‍රතික්ෂේප කරමින් වඩාත් පෘථුල දකුනු ආසියානු සහ ජාත්‍යන්තර සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා ඊලම් සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා සිංහල, දෙමල සහ මුස්ලිම් කම්කරුවන්ගේ එකමුතුව ගොඩ නගන ලෙස අපි ඉල්ලා සිටිමු.

මෙම ක්‍රියාමාර්ගය බැරෑරුම්ව අධ්‍යයනය කරන ලෙසත් සසප සහ ලොව පුරා එහි සහෝදර පක්ෂ විසින් පල කරනු ලබන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නිතිපතා කියවන ලෙසත් කම්කරුවන්ගෙන් ඉල්ලා සිටිමු. අන් සියල්ලට මත් වඩා සසපට බැඳී මෙම ඉදිරිදර්ශනය සඳහා සටන් වැදීමට අවශ්‍ය කම්කරු පන්තික මහජන පක්ෂය ගොඩ නගන ලෙස වැඩ කරන ජනතාවගෙන් සහ තරුනයන්ගෙන් අපි ඉල්ලා සිටිමු.